**ශීර්ෂය 9 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

**----------------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

**------**

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳවමාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 20 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අධිකාරයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2022 ජූනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන්විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා  සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීදැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 අග්‍රිම කළමනාකරණය**

--------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අධිකාරයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.19,200 ක්වූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයක් නොතිබුණද අධිකාරය විසින් විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.19,200 දක්වා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට වූ අග්‍රිම ශේෂය රු.19,200 නිවැරදිව භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලදී. එම අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නොපෙන්වන ලද්දේ ගිණුම් තුලනය සඳහා එය අවශ්‍ය වූ බැවිනි. මූල්‍ය තත්ත්ව ප්‍රකාශන පිළියෙල කිරීම සිදු කරන ලද්දේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ගිණුම් නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුවේදී දෙන ලද උපදෙස් පරිදි බව වැඩිදුරටත් දන්වනු කැමැත්තෙමි. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය නිවැරදිව සටහන් කළ යුතු වේ. |

## 2.2 වියදම් කළමනාකරණය

--------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හා කොවිඩ් වසංගත තත්ත්වය නිසා වියදම් අවම වීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 03 ක සියයට 77 සිට සියයට 100 දක්වා ඉතිරිවීම් පැවතුනි. මූලධන වැය විෂයයන් 02 ක එකතුව රු.170,000 ක්වූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | වියදම් ඇස්තමේන්තු පිළියෙල කරන ලද්දේ සාමාන්‍ය තත්ත්වයන් යටතේ දැරීමට සිදුවන වියදම් පුරෝකථනය කිරීමෙනි. 2021 වර්ෂයේ රටේ පැවති අවිනිශ්චිත වාතාවරණය සහ කාර්ය මණ්ඩල හිඟය අනුව ඇස්තමේන්තුගත වියදම් දැරීමක් සිදු නොවීය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වේ. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>-------------- | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| (අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් විගණන වාර්තාව මෙම විනිශ්චය අධිකාරය වෙත ලැබීමෙන් පසු අපේක්ෂිත කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | විගණන පනත ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සීමිත කාර්ය මණ්ඩලය හා කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා 2021 වර්ෂය තුලදී මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ක්‍රියාවට නැංවීම දුෂ්කර විය. එසේ වුවද 2022 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------------

**3.1 සැලසුම් කිරීම**

--------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව රජයේ සියළුම ආයතන විසින් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වුවත් අධිකාරය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති වසංගත තත්ත්වය තුල ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා පැවතිණ. 2022 සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කරමින් පවතී. | සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කළ යුතු වේ. |

**3.2 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අධිකාරය වෙත ඉදිරිපත් කරන යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර යම් සුදුස්සක් කළ යුතු බව සඳහන් වේ. එසේ වුවද, අධිකාරය වෙත අභියාචනයක් ලැබී මාස 02 ක් ඇතුළත විභාග කර අවසන් කිරීමක් විගණනයේදී නිරීක්ෂණය නොවූ අතර පනතේ එම වගන්තිය මේ දක්වා සංශෝධනය කර නොතිබුණි. | ඉදිරිපත් වන අභියාචනයක් පිළිබඳව කටයුතු කිරීමේදී මාස 02 ක් ඇතුළත විභාග කර අවසන් කිරිමට නියමිත වුවත් අනපේක්ෂිතව පැන නඟින කරුණු හා අභියාචන විශාල සංඛ්‍යාව මත මාස 02 ක් ඇතුළත විභාග කර තීරණ ලබාදීම ප්‍රායෝගික නොවේ. අභියාචන විභාග කිරීමේදී සහ තීරණ ලබාදීමේදී ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලයේ සක්‍රීය සහභාගිත්වය අනිවාර්ය වේ.අධිකාරයේ පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අභියාචනයක් ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර අවසන් කිරීම පිළිබඳ ඇති වගන්තිය සංශෝධනය කිරීමේ අවශ්‍යතාවයක් නොපෙනේ. | පනතේ 7 වන වගන්තිය ප්‍රකාරව අධිකාරය වෙත ඉදිරිපත් කරන යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස 02 ක් ඇතුළත විභාග කර යම් සුදුස්සක් කළ යුතු වේ. එසේ නොමැති නම් පනතේ එම වගන්තිය සංශෝධනය කිරීම සඳහා කටයුතු කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට කටයුතු කිරීමට පැවති අභියාචන සංඛ්‍යාව 929 ක්වූ අතර අධිකාරය විසින් එම අභියාචනවල කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. | කාර්ය මණ්ඩල හිඟය මත මෙවැනි සංඛ්‍යාලේඛණ විශ්ලේෂණයක් සඳහා නිලධාරියකු සපයා දීමේ ගැටළු පවතී. එසේ වුවද 2022 සඳහා මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය. | කටයුතු කිරීමට පවතින අභියාචනවල කාල විශ්ලේෂණයක් ලබා ගත හැකි වන පරිදි තොරතුරු යාවත්කාලීනව පවත්වාගත යුතු වේ. |

## 4. යහපාලනය

### 4.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් මගින් පහසුකම් සලසා තිබිය යුතු වුවත් අධිකාරය ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් අනුව ICTA ආයතනය මඟින් නිල වෙබ් අඩවියක් නිර්මාණය කර ගැනීම සඳහා කටයුතු කරගෙන යමින් පවතී. | මහජනයාගේ අවශ්‍යතාවය හා ආයතනය පිළිබඳ චෝදනා හෝ ප්‍රසංශා පළකිරීමට නිල වෙබ් අඩවියක් මගින් පහසුකම් සලසා තිබිය යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරය විසින් විගණනය වෙත ලබාදුන් තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 31 ක් වුවද තත්‍ය කාර්ය මණ්ඩලය 19 ක් වූ හෙයින් කාර්ය මණ්ඩලයේ 12 ක පුරප්පාඩු පැවතුනි. | ඔබේ නිරීක්ෂණය සමඟ එකඟ වෙමි. පුරප්පාඩු සම්පූර්ණ කරගෙන රාජ්‍ය සේවය ඇතුළු සිවිල් සමාජය වෙත උපරිම සේවයක් ලබාදීම සඳහා මෙම අධිකාරය අදාල ආයතන සමඟ ක්‍රියා කරන බව සඳහන් කරනු කැමැත්තෙමි. | පුරප්පාඩු පිරවීම ට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වේ. |